COVID-19 පරීක්ෂා කිරීම

# සත්‍ය කරුණු ලබා ගන්න.

## COVID-19 පරීක්ෂා කිරීමෙන් ප්‍රජාව ආරක්ෂා වේ

ඔබ එන්නත් ලබා ගෙන තිබුණද ඔබට COVID-19 ආසාදනය විය හැකි අතර, ඔබට කිසිම අසනීප ගතියක් නොදැනෙන හෙයින් ඔබ එය බව දැන නොසිටිය හැක. ඔබ පරීක්ෂා කර ගත් විට ඔබට ඔබවත්, ඔබේ ආදරණීයයනුත්, ඔබේ ප්‍රජාවත් ආරක්ෂා කර ගත හැක.

එන්නත් ලබා ගෙන තිබුණත්, අසනීප ගතියක් දැනුනත් නොදැනුනත්, ජනතාව පරීක්ෂා සිදු කර ගනිති. ඒ එමගින් අපේ ප්‍රජාවන් ආරක්ෂා වන හෙයිනි. වැඩිහිටියන්, දරුවන් සහ ළදරුවන් ද ඇතුලුව ඕනෑම අයකුට පරීක්ෂාව කර ගත හැක.





### පරීක්ෂා කර ගත යුත්තේ කුමන අවස්ථාවේදී ද

- ඔබට රෝග ලක්ෂණ තිබේනම්
- ඔබ ධනාත්මක වූ කිසියම් අයෙකු සමීපයේ සිටියේ නම්
- ඔබ සංචාරය කිරීමට පෙර සහ පසුව
- බොහෝ පුද්ගලයින් සමඟ ඔබ ගෘහස්ත ස්ථානවල රැස්වීමට පෙර සහ පසුව
- ඔබේ පාසල හෝ කාර්යාලය මගින් පරීක්ෂාවක් කර ගන්නා ලෙස නියම කළහොත්

### රෝග ලක්ෂණ

- උණ
- කැස්ස
- හුස්ම ගැනීමේ අපහසුව
- දැඩි වෙහෙස
- උගුරේ වේදනාව
- සොටුදියර ගලන හෝ සිර වූ නාසය
- මාංශ පේශී වේදනාව හෝ ඇඟ රිදීම
- හිසරදය
- වමනය හෝ පාචනය
- රසය හෝ සුවඳ නොදැනී යාම

**මන්ද COVID-19 රෝගයේ, ඉන්ෆ්ලුවෙන්සා (ෆ්ලූ) රෝගය සහ සාමාන්‍ය සෙම්ප්‍රතිශ්‍යාවේ රෝග ලක්ෂණ සමාන බැවින්, ඔබට COVID-19 තිබේදැයි දැනගැනීම සඳහා ඇති එකම ක්‍රමය පරීක්ෂා කර ගැනීම වේ.**

NRC-RIM
National Resource Center for Refugees, Immigrants, and Migrants

5 Apr 2022

වැඩි විස්තර සඳහා: cdc.gov/coronavirus

# පරීක්ෂා කර ගත යුත්තේ කුමන ස්ථානවලින්ද

### බොහෝ ස්ථානවලින් පරීක්ෂාවන් කරවා ගත හැකිය

ඔබට වෛද්‍යවරයෙකුගේ කාර්යාලයකදී, ප්‍රජා පරීක්ෂා කිරීමේ ස්ථානයකදී, කාර්යාලයේදී, පාසලේදී, හෝ ඖෂධශාලාවකදී ඔබට පරීක්ෂා කර ගත හැකිය. බොහෝ ඖෂධශාලාවල ඔබට මනිවසේදී පරීක්ෂාවන් කර ගත හැකි පරීක්ෂණ කට්ටල තිබේ.

### පරීක්ෂා කිරීම රහස්‍ය වේ

ඔබේ සංක්‍රමණික තත්ත්වය කුමක් වුවත් ඔබට වෛද්‍ය රක්ෂණයක් හෝ හැඳුනුම්පතක් තිබුණත් නැතත් ඔබට රහස්‍ය පරීක්ෂාවක් සිදු කර ගත හැකිය.

# පරීක්ෂා කිරීම වේගවත් සහ ආරක්ෂිත වේ



### පරීක්ෂා කර ගත හැකි බොහෝ ක්‍රම තිබේ

ඔබට හෝ සෞඛ්‍ය ආරක්ෂණ සේවකයෙකුට ඔබේ නාසයෙන්, උගුරෙන්, හෝ කෙළවලින් සාම්පල් ලබා ගනු ඇත.

සමහර පරීක්ෂණවලට මුදල් වැයවිය හැකි අතර තවත් සමහර ඒවා නොමිලේ සිදු කර ගත හැක. වැඩි විස්තර සඳහා ඔබේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව අමතන්න

### ඔබ ප්‍රතිඵල ලැබෙන තෙක් අපේක්ෂාවෙන් සිටින අතරතුර

සමහර පරීක්ෂණවලින් ප්‍රතිඵල ඉක්මණින් මලැබෙන අතර, සමහර පරීක්ෂණවල ප්‍රතිඵල ලැබීමට තරමක කාලයක් ගත වේ.

ඔබට රෝගී බවක් දැනේ නම් නිවසේ රැඳී සිටීම, මුහුණු ආවරණයක් පැළඳීම, සහ සමාජ දුරස්තභාවය පිළිපැදීම මගින් අන් අයව ආරක්ෂා කරන්න.

## ඔබ ප්‍රතිඵල ධනාත්මක නම්

ඔබගේ පරීක්ෂණ ධනාත්මක නම් හෝ ඔබට රෝගී බවක් දැනේ නම් ඔබේ ප්‍රජාව ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි වැදගත්ම දේවලින් එකක් වන්නේ සේවයට, පාසලට, හෝ සමාජීය කටයුතුවලින් බැහැරව සිටීම වේ.

විවේක ගැනීම, බොහෝ ජලය පානය කිරීම, සහ ඔබගේ රෝග ලක්ෂණ බරපතළ වේ නම් වෛද්‍යවරයා ඇමතීම මගින් ඔබ ගැන සොයා බලන්න.

## ඔබගේ ප්‍රතිඵල ඍණාත්මක නම්

මුහුණු ආවරණයක් පැළඳීම, සමාජ දුරස්තභාවය ආරක්ෂා කිරීම, සහ ඔබට රෝගී බවක් දැනෙන විට නිවසේ රැඳී සිටීම මගින් ඔබව ආරක්ෂා කර ගැනීම අඛණ්ඩව සිදු කරන්න.

ඔබේ රෝග ලක්ෂණ පහව නොයයි නම් හෝ ඔබේ ප්‍රජාව ඔබ අඛණ්ඩව ආරක්ෂා කරන බවට වග බලා ගැනීමට ප්‍රමාණවත් තරම් කාලයකින් නැවත නැවතත් පරීක්ෂාවක් කරවා ගන්න.

**ඔබ දැනටමත් එන්නත් ලබා ගෙන නොමැති නම් හෝ බූස්ටරය ලබා ගෙන නොමැති නම්, ඔබ සුවපත් වූ පසුව ඔබට එන්නතක් ලබා ගත හැකිය. ඔබට එන්නතක් ලබා ගැනීමට හැක්කේ කවදාදැයි ඔබේ වෛද්‍යවරයාගෙන් විමසා දැන ගන්න.**



**ඔබ දැනටමත් එන්නත් ලබා ගෙන නොමැති නම් හෝ බූස්ටරය ලබා ගෙන නොමැති නම්, වහාම එන්නතක් ලබා ගන්න. ඔබ එන්නත් ලබා ගෙන සිටී නම්, ඔබ සහ අන් අය ආරක්ෂා කර ගැනීමට බූස්ටරය ලබා ගැනීමට වග බලා ගන්න.**

**ඔබවම ආරක්ෂා කර ගන්න. ඔබේ ප්‍රජාව ආරක්ෂා කරන්න. එන්නත් ලබා ගන්න.**